৪ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2194/57 - 2020 සැප්තැම්බර් මස 24 වැනි බ්‍රහස්පතින්දා - 2020.09.24

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*යොමුව*: DIVKW/LND/ACQLA/4-D/36
4-3/8/2017/PC/477

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම/පරවශතාව ලබා ගැනීමට රජය අදහස් කරන බැවින්, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 07 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ/පරවශතාවේ විස්තර:*

වයඹ පළාතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ කුලියාපිටිය බටහිර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කටුගම්පල හත්පත්තුවේ දකුණු යටිකහකෝරලේ අංක 1158 ඇස්සැද්දුම ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ අස්වැද්දුම ගමේ අ.ග.පි. 976 අති අංක 14 පත්‍ර අංක 09 හි පහත සඳහන් බිම් කැබැල්ල:

**කැබලි අංකය 75**

ඉඩමේ නම: අඹගහමුලවත්ත, තල්ගහමුලවත්ත ඉඩම; විස්තරය: ගෙවත්ත, අවුරුදු 35-40 වයසැති පොල්ගස් 12, අවුරුදු 5-10 වයසැති පොල්ගසක්, අවුරුදු 15-20 වයසැති කුඹුක් ගසක්, අඹ ගසක්, නෙල්ලි ගසක්, ස්ථිර ගොඩනැගිල්ලක්, බුදුමැදුරක්, සිමෙන්තියෙන් බඳින ලද ලිඳක් සහ වතුර ටැංකි දෙකක් ඇත. ස්ථිර ගොඩනැගිල්ල ආයුර්වේද දෙපාර්තමේන්තුව විසින් ඉදිකර ඇත; හිමිකම් කියන්නේ: කේ. ජී. එස්. පෙරේරා මයා, අංක 22, ආනන්ද මාවත, කුලියාපිටිය; ප්‍රමාණය: හෙක්. 0.1728.

*මායිම් .- උතුරට*: 2F සහ 8 වැනි බිම් කැබැලි; *නැගෙනහිරට*: 8 සහ 2E වැනි බිම් කැබැලි; *දකුණට*: 2E වැනි බිම් කැබැල්ල; *බටහිරට*: 2G සහ 2F වැනි බිම් කැබැලි.

ඉහත සඳහන් ඉඩමට /පරවශතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2020.12.30 වැනි දින පෙ.ව. 10.00ට කුලියාපිටිය බටහිර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදී මා සම්මුඛ විය යුතුයි.

තවද 2020.12.09 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයන් එකී ඉඩම/පරවශතාවය ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ

විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම්දිය යුතුයි.

ඩී. එම්. ඒ. කේ. දිසානායක,
ප්‍රාදේශීය ලේකම්,
කුලියාපිටිය බටහිර.

2020 සැප්තැම්බර් මස 22 වන දින
කුලියාපිටිය බටහිර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

10 - 339

---

## ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

### 7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ අංකය* : වඩ/එන්/එල්ඒ/ඩීඑස්.
*ඉඩම් අමාත්‍යාංශ අංකය* : 4-3/8/2016/එච්ඒ/368.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම/පරවශ්‍යතාව ලබා ගැනීමට රජය අදහස් කරන බැවි 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ/පරවශ්‍යතාවේ විස්තර:*

මූලික පිඹුර අංකය: යා-2926; කැබලි අංක: 1; පිහිටීම, ගමේ: කොට්රාවත්තයි; ග්‍රාම නිලධාරී කොට්ඨාසය: ජේ/409, පුලෝලි මධ්‍යම; ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය: වඩමරාච්චි උතුර; දිස්ත්‍රික්කය: යාපනය; පළාත: උතුර.

**කැබලි අංකය 01**

ඉඩමේ නම: කොට්රාවත්තයි; විස්තරය: වත්ත, ස්ථිර ගොඩනැගිලි 10, තාවකාලික ගොඩනැගිලි 4, ළිඳ - 1; හිමිකම් කියන අය: ඉඩම් මිලදී ගැනීමේ කමිටුව; ප්‍රමාණය: හෙක්ටයාර් 0.3376.

ඉහත සඳහන් ඉඩමට/පරවශතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තමතමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2020.07.10 වැනි දින පෙ.ව. 10.00 ට වඩමරාච්චි උතුර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදී මා සම්මුඛ විය යුතුයි.

තවද 2020.07.06 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම/පරවශතාවයට ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම්දිය යුතුයි.

ආල්වාප්පිල්ලයි සිරි,
ප්‍රාදේශීය ලේකම්,
පේදුරුතුඩුව.

2020 ජුනි මස 10 වැනි දින,
ප්‍රාදේශීය ලේකම් කාර්යාලය,
පේදුරුතුඩුව.

10 - 340